SLGURU.LK

# කලාප අධ්‍යාපන කාර්යාලය කොළඹ - ශ්‍රී ජයවර්ධනපුර
## வலயக் கல்வி காரியாலயம் கொழும்பு - ஸ்ரீ ஜயவர்தனபுரம்
## Zonal Education Office Colombo - Sri Jayawardhanapura

දෙවන වාර පරීක්ෂණය - 2025

இரண்டாம் தவணைப் பரீட்சை - 2025

Second Term Test - 2025

**11 ශ්‍රේණිය - ඉතිහාසය**

**1 පත්‍රය** **කාලය පැය 01**

---

**සැලකිය යුතුයි:**

**I.** සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80ක් හිමි වේ.

**II.** අංක 01 සිට අංක 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1) (2) (3) (4) උත්තර වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

**III.** ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01. ශ්‍රී ලංකාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතරින් වඩාත් පැරණිතම මූලාශ්‍රය ලෙස සැලකෙන්නේ,
(1) ථූපවංසය . (2) මහාවංසය
(3) දීපවංසය, (4) නිකාය සංග්‍රහය

02. ගල්පොත සෙල්ලිපිය කරවන ලද්දේ,
(1) පණ්ඩුකාභය රජතුමා ය. (2) නිශ්ශංකමල්ල රජතුමා ය.
(3) 1 වන විජයබාහු රජතුමා ය (4) 1 වන කාශ්‍යප රජතුමා ය.

03. සාහිත්‍ය මූලාශ්‍ර මගින් විස්තර කෙරෙන අතීත කාලය ආරම්භයට පෙර තිබූ යුගය පොදුවේ හැඳින්වෙන්නේ,
(1) ප්‍රාග් ඓතිහාසික යුගය (2) පූර්ව ඓතිහාසික යුගය
(3) ගොවිතැන් යුගය (4) මුල් ඓතිහාසික යුගය

04. මෙරට මුල්ම ජනාවාස පිහිටුවා ගන්නා ලද්දේ,
(1) හෝමෝ ඉරෙක්ටස්වරු ය. (2) ඔස්ට්‍රලෝපිතකස්වරු ය.
(3) නියෙන්ඩතාල්වරු ය. (4) හෝමෝ සාපියන්වරු ය.

05. සෑම පවුලකම ප්‍රධානියා හඳුන්වන ලද්දේ කුමන නමින්ද ?
(1) පරුමක (2) ගමික (3) ගෘහපති (4) පරුමකලු

06. මින්නේරිය දෙවියන් ලෙස හැඳින්වූ රජතුමා වූයේ,
(1) නිශ්ශංකමල්ල රජතුමා (2) මහසෙන් රජතුමා
(3) කූටකණ්ණ අභය රජතුමා (4) දේවානම්පියතිස්ස රජතුමා



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

07. වල්ලිපුරම් රන්පතෙහි සඳහන් පාලන කාලය තුළ, වසභ රජතුමා යටතේ, සෘෂිගිරි ඇමතිවරයා පාලනය කළේ,

(1) අනුරාධපුරය
(2) රුහුණු දේශය
(3) උතුරු ඉන්දියාව
(4) නකදිව හෙවත් නාගදීපය

08. ශ්‍රී ලංකාවට ශ්‍රී මහා බෝධීන් වහන්සේ රැගෙන ඒම සිදු වූ වරාය වන්නේ,

(1) ජම්බුකෝලපට්ටන
(2) ලංකාපට්ටන
(3) ගෝකණ්ණතිත්ථ
(4) මහාතිත්ථ

09. ක්‍රි.පූ.1129 දී පමණ මෙරට ඉදි කළ පැරණිතම නිවස පුරාවිද්‍යාඥයින් විසින් සොයාගනු ලැබූ ස්ථානය වූයේ,

(1) රංචාමඩම
(2) උඩරංචාමඩම
(3) ඉබ්බන්කටුව
(4) බෙරගල

10. නෙස්ටෝරියානු කතෝලික නිකායට අයත් කුරුසය සටහන් කරන ලද ගල් පුවරුව ඉදිකොට ඇති බවට සඳහන් වන්නේ,

(1) පොලොන්නරුව
(2) මහනුවර
(3) යාපනය
(4) අනුරාධපුරය

11. වැව්වල ජලය මුදා හැරීමේ දී වැව් බැම්ම මත ඇති කරන පීඩනය පාලනය කිරීමට එකල භාවිත කළ තාක්ෂණය වූයේ,

(1) සොරුව්ව ඉදිකිරීම ය
(2) බිසෝකොටුව ඉදිකිරීම ය
(3) පිටවාන ඉදිකිරීම ය
(4) ඇළ මාර්ගය ඉදිකිරීම ය

12. අතීතයේ මෙරට සිටි ගැමියන් කිරිමඩු ශාන්තිකර්මය පවත්වනු ලැබුවේ,

(1) ගවයන්ගේ ආරක්ෂාවට
(2) ගැබිනි මව්වරුන්ගේ ආරක්ෂාවට
(3) කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන්
(4) රජුගේ ආරක්ෂාව වෙනුවෙන්

13. අනුරාධපුර රාජධානියේ අවසන් පාලකයා සහ පොළොන්නරුව රාජධානියේ ආරම්භක රජතුමා වන්නේ,

(1) පණ්ඩුකාභය රජතුමා - 1 වන පරාක්‍රමබාහු රජතුමා
(2) දේවානම්පියතිස්ස රජතුමා - නිශ්ශංකමල්ල රජතුමා
(3) V වන මිහිඳු රජතුමා - 1වන විජයබාහු රජතුමා
(4) දුටුගැමුණු රජතුමා - ලීලාවතී බිසව

14. කෝට්ටේ රාජධානිය පිහිටුවන ලද්දේ,

(1) සපුමල් කුමරයා.
(2) හයවන වන පරාකුමබාහු රජතුමා.
(3) අලකේශ්වර ඇමතිතුමා.
(4) ජයබාහු රජතුමා

15. ක්‍රි.ව. 1594 දී දන්තුරේ සටනට නායකත්වය දෙමින් පෘතුගීසීන් අන්ත පරාජයට පත් කරනු ලැබුයේ,

(1) 1 වන විමලධර්මසරිය රජතුමා
(2) සෙනරත් රජතුමා
(3) ii වන රාජසිංහ රජතුමා
(4) ii වන විමලධර්මසූරිය රජතුමා

16. මහනුවර රාජධානියේ නායක්කර් රාජවංශයේ ආරම්භක රජතුමා වන්නේ,

(1) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා
(2) රාජාධිරාජසිංහ රජතුමා
(3) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා
(4) ශ්‍රී විජය රාජසිංහ රජතුමා



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

17. 1803 උඩරට රාජ්‍ය අක්‍රමණය කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා සහ එම ආක්‍රමණය පරාජයට පත් කළ උඩරට රජතුමා පිළිවෙලින් දැක්වූ විට නිවැරදි පිළිතුර වන්නේ,

(1) ෆෙඩ්‍රික් නෝර්ත් - ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා
(2) තෝමස් මෙට්ලන්ඩ් -රාජාධිරාජසිංහ
(3) රොබට් බ්‍රවුන්රිග් - ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා
(4) රොබට් නොක්ස් - කීර්ති ශ්‍රී රාජසිංහ

- ප්‍රශ්න අංක 18, 19, 20 පිළිතුරු ලිවීමේ දී පහත අ සහ ආ තීරුවල සඳහන් තොරතුරු උපයෝගී කර ගන්න.

| අ | ආ |
|---|---|
| A. ජොහැන්නස් ගුටන්බර්ග් | F. දුරේක්ෂය |
| B. ලියනාඩෝ ඩාවින්සි | G. අවසාන විනිශ්චය |
| C. අයිසෙක් නිව්ටන් | H. පියේටා ප්‍රතිමාව |
| D. මයිකල් ආන්ජිලෝ | I. අන්තිම රාත්‍රී භෝජන සංග්‍රහය |
| E ගැලීලියෝ ගැලීලි | J. මුද්‍රණ යන්ත්‍රය |
| | K. ගුරුත්වාකර්ෂණ නියමය. |

18. දුරේක්ෂය නිපදවීම සහ අවසාන විනිශ්චය චිත්‍රය අඳිනු ලැබුවේ,

(1) AB (2) CD (3) DE (4) ED

19. ජොහැන්නස් ගුටන්බර්ග් සහ ලියනාඩෝ ඩාවින්චි ගේ නිර්මාණ පිළිවෙලින් ,

(1) FI (2) JI (3) JH (4) WJ

20. පියේටා ප්‍රතිමාව නිර්මාණය කිරීම සහ ගුරුත්වාකර්ෂණ නියමය සොයා ගැනීම පිළිවෙලින්,

(1) AE (2) DB (3) DC (4) DE

21. යුරෝපයේ කාර්මික විප්ලවය ආරම්භ වූ රට වන්නේ,
(1) ඉතාලිය (2) ජර්මනිය (3) ප්‍රංශය (4) බ්‍රිතාන්‍යය

❖ පහත වගුව උපයෝගී කර ගනිමින් ප්‍රශ්න අංක 22 සිට 25 තෙක් පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| A. රිචඩ් ආක්රයිට් | E. ආරක්ෂක ලාම්පුව |
| B හම්ප්‍රි ඩේවි | F. රූපවාහිනිය |
| C ජෝර්ජ් ස්ටීවන්සන් | G ගුවන් විදුලිය |
| D ජෝන් ලොගී බෙයාර්ඩ් | H දුම්රිය එන්ජිම |
| | I ජල බලයෙන් ක්‍රියා කරන නූල් කටින යන්ත්‍රය |

22. නූල් කටින යන්ත්‍රය සොයාගනු ලැබුයේ,

(1) A (2) B (3) C (4) D

23. ආරක්ෂක ලාම්පුව නිපදවනු ලැබුයේ,

(1) A (2) B (3) C (4) D



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

24. ජෝර්ජ ස්ටීවන්ගේ සොයාගැනීම වන්නේ,

(1) E (2) F (3) G (4) H

25. ජෝන් ලොගි බෙයාර්ඩ්ගේ නිර්මාණය වන්නේ,

(1) E (2) F (3) G (4) H

26. කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස මෙරට කෝපි කෙටීමේ මෝලක් ආරම්භ කළ ආණ්ඩුකාරවරයා වන්නේ,

(1) තෝමස් මෙට්ලන්ඩ් (2) එඩ්වඩ් බාන්ස්
(3) රොබට් බ්‍රවුන්රිග් (4) ෆෙඩ්රික් නෝර්ත්.

27. ඉංග්‍රීසින් විසින් හඳුන්වා දුන් ව්‍යවස්ථාදායක සභාවෙහි ප්‍රථම වරට නිල නොලත් සාමාජිකයන් සංඛ්‍යාව බහුතරය වූ ප්‍රතිසංස්කරණය වූයේ,

(1) කෝල්බෲක් අසංස්කරණය (2) කෲව් මැකලම් ප්‍රතිසංස්කරණය
(3) මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය (4) ඩොනමෝර් ප්‍රතිසංස්කරණය

28. ඉන්දියාවේ පිහිට වූ ප්‍රංශ වෙළඳ මධ්‍යස්ථාන වන්නේ,

(1) මදුරාසිය සහ බොම්බාය (2) බෝම්බාය සහ කල්කටාව
(3) පොන්ඩිචෙරි සහ කරිකාල් (4) මදුරාසිය සහ කල්කටාව

29. ක්‍රිස්තු වර්ෂ 1762 දී ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම ඉංග්‍රීසි නියෝජිතයා (දූතයා) වන්නේ,

(1)රොබට් නොක්ස් (2) රොබට් ඇන්ඩෲස්
(3) හියු බොයිඩ් (4) ජෝන් පයිබස්

30. කිව් ලිපිය රැගෙන මෙරටට පැමිණි ඉංග්‍රීසින්, එය භාරදුන් ලන්දේසි ආණ්ඩුකාරවරයා වූයේ,

(1) ෆන් එන්ගල්බෙග් (2) ආකර් හැව්ලොක්
(3) රොබට් මාර්වර් (4) ස්ටුවට් මැකාන්සි

31. ක්‍රි.ව. 1848 උඩරට කැරැල්ල මර්දනය කළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා වන්නේ,

(1) රොබට් බ්‍රවුන්රිග් (2) ෆෙඩ්‍රික් නෝර්ත්
(3) තෝමස් මෙට්ලන්ඩ් (4) ටොරින්ටන් සාමි

පහත A, B, C හා D යුගලවලින් දැක්වෙන ප්‍රකාශ යුගල අධ්‍යයනය කර ප්‍රශ්න අංක 32 – 35 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**A.** 1. රොබට් ඇන්ඩෲස් උඩරටට පැමිණීම
2. ඉංග්‍රීසින් පහත රට ප්‍රදේශ යටත් කර ගැනීම

**B.** 1. 1798 සිට 1802 දක්වා ලංකාවේ වෙරළබඩ ප්‍රදේශයේ ද්විත්ව පාලනය ක්‍රියාත්මක වීම
2. ආණ්ඩුකාරවරයා ට වෙළඳ සමාගමෙහි නිළධාරීන්ගෙන් සහය නොලැබීම

**C.** 1. රාජාධිරාජසිංහ රජුගෙන් පසු රජ බවට පත් වීම,
2. මුත්තුසාමි කුමාරයා

**D.** 1. 1840 මුඩුබිම් පනත ක්‍රියාත්මක වීම නිසා උඩරැටියන් පාරම්පරිකව භුක්ති විඳි ඉඩම් අහිමිවීම.
2. 1848 කැරැල්ල ආරම්භ වීම.



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

32. පළමුවැන්න සිදුවීමත් සමග මෙරට ලන්දේසි පාලනය අවසන් විය

(1) A (2) B (3) C (4) D

33. දෙවැන්න ක්‍රියාත්මක වීම නිසා පළමුවැන්න අහෝසි වීම.

(1) A (2) B (3) C (4) D

34. පළමුවැන්න සහ දෙවැන්න අතර සම්බන්ධයක් නො දක්වන පද යුගලය කුමක්ද?

(1) A (2) B (3) C (4) D

35 පළමුවැන්න ක්‍රියාත්මක වීම දෙවැන්න ඇතිවීමට හේතු විය.

(1) A (2) B (3) C (4) D

36. ලංකාවේ ප්‍රථම වරට ව්‍යවස්ථාදායකය හා විධායක සභා පිහිට වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය වන්නේ,

1. කෝල්බෘක් ආණ්ඩු ක්‍රමය
2. කෲව් මැකලම් ආණ්ඩුක්‍රමය
3. මැනිං ඩෙවන්ෂයර් ආණ්ඩුක්‍රමය
4. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය

37. හියුක්ලිෆඩ් ආණ්ඩුකාරවරයා විසින් මෙම ආණ්ඩු ක්‍රමය යටතේ තමාට ලංකාව පාලනය කිරීම අපහසු බව යටත් විජිත ලේකම් කාර්යාලට දන්වා සිටි ආණ්ඩුක්‍රමය වන්නේ,

(1) කෝල්බෘක් ආණ්ඩු ක්‍රමය (2) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය (3) මැනිං ඩෙවන්ෂයර් ආණ්ඩුක්‍රමය (4) සෝල්බරි ආණ්ඩුක්‍රමය

38. 1931 බිහි වූ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මුලසුන හොබවන ලද්දේ,

1. රාජ්‍ය ලේකම්
2. ආණ්ඩුකාරයා
3. කතානායකවරයා
4. සභා නායකවරයා

39. ශ්‍රී ලංකාවේ පිහිටි තේ, පොල් හා රබර් පර්යේෂණායතන පිළිවෙලින් දැක්වූ විට,

(1) අගලවත්ත, ලුණුවිල, තලවකැලේ
(2) කිලිනොච්චිය, අනුරාධපුරය, මාතර
(3) තලවකැලේ, ලුණුවිල, අගලවත්ත
(4) මාතලේ, හම්බන්තොට, මඩකලපුව

40. නඩේස අයියර් මහතා නායකත්වය දැරූ ක්ෂේත්‍රය වන්නේ,

(1) වතුකම්කරු ක්ෂේත්‍රය (2) කොළඹ රෙදි සෝදන්නන්ගේ ක්ෂේත්‍රය
(3) කරත්තකරුවන්ගේ ක්ෂේත්‍රය (4) මුද්‍රණ කම්කරුවන්ගේ ක්ෂේත්‍රය



SLGURU.LK
Education Purpose Only

**කලාප අධ්‍යාපන කාර්යාලය කොළඹ - ශ්‍රී ජයවර්ධනපුර**
வலயக் கல்வி காரியாலயம் கொழும்பு - ஸ்ரீ ஜயவர்தனபுரம்
Zonal Education Office Colombo - Sri Jayawardhanapura
**දෙවන වාර පරීක්ෂණය - 2025**
இரண்டாம் தவணைப் பரீட்சை - 2025
Second Term Test - 2025

**11 ශ්‍රේණිය - ඉතිහාසය**

**II පත්‍රය** කාලය : පැය 03

---

**උපදෙස් :**

- I කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ.
- IIකොටසින් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 6කි.

---

## I කොටස

01.

(අ) පහත (I) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමෙහි ද (II) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමේ කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

I. යාපනය, ඉරණමඩු වැව, කෝනේෂ්වරම් කෝවිල, පුත්තලම, අනුරාධපුරය, කලා වැව, මඩකලපුව, දැදුරු ඔය, මහනුවර, මිනිහා ගල් කන්ද, මාතර, පරාක්‍රම සමුද්‍රය (ලකුණු 12)

II. කල්කටා, බ්‍රිතාන්‍ය, රතු මුහුද, බෙංගාල බොක්ක, ඉතාලිය, බතාවිය ( ලකුණු 06 )

(ආ)

I. පහත A, B,C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන්/ ස්ථානවලට අදාල පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A. දඹුල්ලේ පිහිටි පූර්ව ඓතිහාසික යුගයට අයත් සුසාන භූමිය නම් කරන්න.
B. සටන් ව්‍යාපාරයක් මගින් චෝල පාලකයන් පරදා රට එක්සේසත් කොට පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය කර ගත් රජතුමා නම් කරන්න.
C. උඩරට ප්‍රදේශ ආශ්‍රිතව මුල්වරට ස්වාධීන රාජ්‍යයක් ගොඩනැගූ පාලකයා නම් කරන්න.
D. ක්‍රි.ව. 1602 දී පළමු වන විමලධර්මසූරිය රජතුමා හමු වූ ලන්දේසි දූතයාගේ නම ලියන්න. (ලකුණු 1 × 4)

II. A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A රූපය



1. මෙහි දැක්වෙන සථූපය නම් කරන්න?
2. මෙම ස්තූපය පිහිටා ඇති දිස්ත්‍රික්කය කුමක් ද?
3. මෙම ස්තූපය කරවූ රජතුමා නම් කරන්න.
4. මෙම සථූපය වටා පවතින ගල් කණු මත ඉදි කළ නිර්මාණය කුමක් ද?

( ලකුණු 1 × 4)



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

B රූපය



III.

1. මෙම B රූපයේ සිටින රජතුමාගේ නම ලියන්න.
2. රජ වීමට පෙර ඔහු භාවිත කළ නම කුමක්ද?
3. මොහු හට රජ බවට පත් වීමට උදව් කළ රදල නායකයා නම් කරන්න.
4. මෙතුමාව අත්අඩංගුවට ගත් බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා නම් කරන්න. (ලකුණු 1 × 4)

## II කොටස

02.

I. A - ශ්‍රී ලංකාව ජනාවාස කළ මුල්ම මානවයා හඳුන්වන නම ලියන්න
B - ඔවුන් ජීවත් වූ පරිසර කලාප දෙකක් ලියන්න (ලකුණු 3)

II. ප්‍රාග් ඓතිහාසික යුගයේ මෙරට පැවැති ජනාවාස හතරක් නම් කරන්න. (ලකුණු 4)

III. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ අභිචාර විධි දෙකක් නම් කොට, එම යුගයේ පැවැති අභිචාර පැහැදිලි කරන්න. (ලකුණු 5)

IV. මුල් ඓතිහාසික යුගයේ මෙරට සිටි මානවයන්ගේ ජීවන රටාව කරුණු දෙකක් යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 6)

03.

I. පහත දැක්වෙන තනතුරු නාම පූර්ව රාජ්‍ය සමයේ දී හැඳින්වූ ආකාරය අනුපිළිවෙලින් ලියා දක්වන්න.
A- පවුලක ප්‍රධානියා
B- ගමක පාලකයා
C- ප්‍රදේශයක ප්‍රධානියා (ලකුණු 3)

II. පැරණි සමාජයේ ගම්කයන් විසින් ඉටු කළ කාර්යයන් දෙකක් නම් කරන්න. (ලකුණු 4)

III. මෙරට රාජ්‍ය උරුමය පැවරුණු ආකාර දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 5)

IV. පළමුවන විජයබාහු රජතුමා ශ්‍රේෂ්ඨ පාලකයෙකු ලෙස හැඳින්වීම සාධක තුනක් යටතේ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 6)

04.

I. ඕනෑම රටක පාලනය මෙහෙයවන ප්‍රධාන ආයතන තුනක් පවතී. එම ආයතන තුන නම් කරන්න. (ලකුණු 3)

II. A - ගැබිණි මව්වරුන්ගේ අවශ්‍යතා වෙනුවෙන් මාතෘ නිවාස ඉදිකළ රජතුමා නම් කරන්න.

B - පළමු වන ගජබාහු රජතුමා පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයට සහභාගි වීම සඳහා ගිය රාජ්‍ය නම් කරන්න.

C - අප රටෙහි දේශපාලන බලය ස්ථාවර පවත්වාගෙන යාම සඳහා තිලෝක සුන්දරී නම් කාලිංග වංශික කුමාරිකාව විවාහ කරගත් පාලකයා නම් කරන්න.

D - යකඩ වැඩ කළ කම්මල්කරුවන් සෙල්ලිපිවල හඳුන්වා ඇති නම කුමක්ද? (ලකුණු 4)

III. පහත සඳහන් පැරණි සමාජයේ භාවිත කළ වචනවලින්, හඳුන්වන ලද්දේ කුමක්දැයි/ කවුරුන්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

A. එක්තැන් සමිය
B. වත් හිමි
C. මහලේ
D. දසගම් ඇත්තන්
E. වෙජ්ජශාලා (ලකුණු 5)

IV. මෙරට පැරණි සමාජය තුළ විසූ ජනතාව අතර ආගමික සහජීවනයක් පැවති බව උදාහරණ තුනක් ඇසුරෙන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6)



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

05.

I. මහනුවර රාජධානිය හැඳින්වීමට භාවිත කළ නම් තුනක් කරන්න (ලකුණු 3)

II. පළමු වන විමලධර්මසූරිය රජතුමා බලයට පත්වීමේ දී මුහුණ දුන් අභියෝග දෙකක් ලියන්න (ලකුණු 4)

III. මහනුවර රාජධානිය තුළ පැවති පහත සමාජ සංවිධානයන් පිළිබඳව කෙටි වාක්‍යයක් බැගින් ලියන්න.

A. ගබඩාගම
B. නින්දගම්
C. විහාරගම්
D. දේවාලගම
E. පරවේනිගම

(ලකුණු 5)

IV. පෘතුගීසීන් ආසියාවට පැමිණීම හා ආසියාවේ බලය ස්ථාපිත කර ගැනීම කරුණු තුනක් යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 6)

06.

I. දහ අටවන සියවස වන විට මෙරටින් අපනයනය කළ වෙළඳ ද්‍රව්‍ය තුනක් ලියන්න (ලකුණු 3)

II. ත්‍රිකුණාමල වරාය කෙරෙහි බ්‍රිතාන්‍යයන්ගේ අවධානය යොමු වීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 4)

III. 1848 නිදහස් සටනට නායකත්වය දුන් නායකයන් දෙදෙනෙකු නම් කොට එම සටනේ ස්වභාවය පැහැදිලි කරන්න. (ලකුණු 5)

IV. බෞද්ධ පුනරුද ව්‍යාපාරය පිළිබඳව පහත සඳහන් කරුණු යටතේ විස්තර කරන්න.

A. මුද්‍රණාල පිහිටුවීම
B. බෞද්ධ පාසැල් පිහිටුවීම

(ලකුණු 06)

07.

I. 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල පැවති ප්‍රධාන ලක්ෂණ තුනක් නම් කරන්න. (ලකුණු 3)

II. කෲව් මැකලම් ප්‍රතිසංස්කරණයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 4)

III. තේ වගාවේ උන්නතියට බලපෑ හේතු දෙකක් ලියා කෝපි වගාව අසාර්ථක වීමට බලපෑ එක් හේතුවක් පැහැදිලි කරන්න. (ලකුණු 5)

IV. බ්‍රිතාන්‍ය පාලන සමය තුළ සිදු වූ සමාජ වෙනස් වීම් තුනක් නම් කොට, පැහැදිලි කරන්න. (ලකුණු 6)

SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

## III කොටස

08.

I. පුනරුද සමයේ සිටි විශ්වය පිළිබඳ නව මත ඉදිරිපත් කළ දාර්ශනිකයන් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 3)

II. පුනරුදය ඇතිවීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 4)

III. පුනරුදය සමයේ වෙනස් වූ කලා ශිල්පයන් දෙකක් නම් කර ඒවායේ වෙනස් වූ ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 5)

IV. පුනරුදය ලංකාව කෙරෙහි බලපෑ ආකාරය පහත සඳහන් ලක්ෂණ යටතේ පැහැදිලි කරන්න.

A. දේශපාලන වෙනස්කම්

B. සමාජ සංස්කෘතික වෙනස්කම් (ලකුණු 06)

09.

I. කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ ප්‍රධාන ක්ෂේත්‍ර තුන නම් කරන්න. (ලකුණු 3)

II. කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 4)

III. කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ වෙනත් ක්ෂේත්‍ර දෙකක් නම් කර එයින් එක් ක්ෂේත්‍රයක් පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 5)

IV. කාර්මික විප්ලවය මගින් ශ්‍රී ලංකාවේ සමාජ ක්ෂේත්‍රයේ ඇතිවූ වෙනස්කම් තුනක් නම් කර ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 06)

----- // ----



SLGURU.LK
Education Purpose Only